06 වන පිටෙන්

මේ නිසා අද මෙරට මෙහෙයවන්නේ කොමිසම් වලට අවශ්‍ය ලෙසද?

ශ්‍රී ලංකා හමුදාවේ හටපිරිස් එක්සත් ජාතීන්ගේ සාම බලකාය වෙත යැවීමට පෙර මානව හිමිකම් කවුන්සිලයෙන් නිෂ්කාෂණ වාර්තා ලබාගැනීමට සිදුවීමෙන් රටේ තත්ත්වය සනාථ වේ.

ඉන්දීය රජය ඉන්දු කාශ්මීරයේ අන්තර්ජාල පහසුකම් මුළුමනින්ම කපා හරිමින් හමුදාවට සියළු බලතල ලබාදෙද්දී මානව හිමිකම් කොමිසම් වලින් උපදෙස් ගන්නේ නැත.

මේ අතර ශවේන්ද්‍ර සිල්වා හමුදාපති ලෙස පත් කිරීමට එරෙහිව ජාත්‍යන්තර මැදිහත්වීම ගැන රියර් අද්මිරාල් සරත් වීර සේකර ජිනීවා මානව හිමිකම් කවුන්සිලයට පැමිණිලි කර ඇත.

එම පැමිණිල්ල ඇතුලත් ලියවිල්ල ඉතාලියේ රණවිරු සේවා මුක්ත සංගමයේ සභාපති සුනිල් ශාන්ත විසින් එක්සත් ජාතීන්ගේ නිලධාරි රසාබි මර්සාබ් වෙත බාරදී රටේ මේ අවස්ථාවට ගෝලීය ශ්‍රී ලංකා සංසදයේ ඊශ්‍රායල් නියෝජිත ජනෙත් විමල ඇතුළු විධායක සභා නිලධාරීන් සහභාගි විය.

මේ අතර එක්සත් ජාතීන්ගේ සංවිධාන ශ්‍රී ලංකා සාමසාධක බලකාය තහනම්කර ඇතැයි වාර්ථා විය. මෙයට හේතු ලෙස දක්වා ඇත්තේ හමුදාපති ලෙස ශවේන්ද්‍ර සිල්වා පත්කිරීමයි. ඔහුට මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ චෝදනා ඇති බවත් ඒ ගැන නොතකා හමුදාපති ලෙස පත්කර ඇති බවත් එක්සත්ජාතීන්ගේ නියෝජ්‍යප්‍රකාශක ෆරහන් හක් පවසා ඇත. මේ වන විට සියදිවි නොතකා ලෙබනනය දකුණු සුඩානය සහ මාලි යන රටවල සාම සාධක බලකා හටයන් 400 ක් සේවය කරති. එසේම මාලි රාජ්‍යේදී එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයකින් ශ්‍රී ලංකා හටයන් දෙදෙනෙක් ජීවිතක්ෂයට පත්වූහ. මේ තහනම පිටුපස සිටියේ කොටි කොන්ත්‍රාත්කාරියක් වූ යස්මින් සූකා ප්‍රමුඛ කොටි ඩයස්පෝරාවයි. ඇය ශ්‍රී ලංකා සාම සාධක බලකාය තහනම් කරන ලෙස ඉල්ලා එක්සත් ජාතීන්ගේ මහ ලේකම් වෙත රහසිගත ලිපියක් යවා තිබූ බව 'ඉරිදා දිවයින' විසින් විශේෂයෙන් (Exclusive) හෙළිකර තිබුණි.

මෙම තහනම ගැන පෙරේදා සවස ප්‍රකාශයක් කළ හමුදාපති ශවේන්ද්‍ර සිල්වා පැවසුවේ ප්‍රශ්නයක් වී ඇත්තේ හමුදා හට යන් නිශ්කාශනය කිරීමේ සිද්ධියක් ග තමා කොළඹ එක්සත් ජාතීන්ගේ නියෝජිතවරිය ඇමතූ අවස්ථාවේ ඇය පැවසුවේ එවැනි තහනමක් පනවා නැති බව යැයි හෙතෙම කියා සිටියේය.

සාම සාධක බළකා හටයන් වසරක් තිස්සේ විදේශගත කිරීමට නොහැකි වී ඇත්තේ මේ නිශ්කාශන ප්‍රශ්නය නිසා බව හමුදාපති වරයා හෙළි කළේය.

# මෙහෙමත් රජවරු හිටියා අප හට

**ශ්‍රී ලංකා රාජාවලියේ අඩුම කාලයන් රජකම් කල රජවරු මෙසේය .**

| | |
|---|---|
| සොත්තිසේන රජු | පැය දෙකහමාරයි |
| වීරබාහු රජු | එක් දිනයි |
| හය වන මිහිඳු රජු | දින පහයි |
| කීර්ති රජු | දින අටයි |
| අනිකංග රජු | දින දාහතරයි |
| සිව රජු | දින විසිපහයි |
| 2 වන වික්‍රමබාහු රජු | මාස තුනයි |
| රාජසරිය රජු | මාස හතරයි |
| සීවලී රැජින | මාස හතරයි |
| කීර්තිසේන රජු | මාස නවයයි |


